# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1986/24 – 2016 සැප්තැම්බර් මස 28 වැනි බදාදා - 2016.09.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (2අ) උපවගන්තිය යටතේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බලතල පැවරීම සම්බන්ධයෙන් වූ සංශෝධිත නියමයයි

1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2අ) උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් බලතල පැවරීමට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1950/47 දරන 2016 ජනවාරි මස 21 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයට* ඇතුළත් 2015.12.23 දිනැති නියමයෙහි උපලේඛන අංක 6 යටතේ ගත් ක්‍රියාමාර්ගයනට අගතියකින් තොරව එම උපලේඛනය ඉවත්කර ඒ වෙනුවට උපලේඛන අංක 6 වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනය ඇතුළත් කරමින් 2016ක් වූ සැප්තැම්බර් මස විසිවැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

කේ. සරත් ගුණතිලක,<br>
සභාපති,<br>
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.<br>
බස්නාහිර පළාත.

2016 සැප්තැම්බර් මස 20 වැනි දින,<br>
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
අංක 109, මහ වීදිය,<br>
බත්තරමුල්ල.

1A - PG 3132—57 (2016/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛන අංක 06**

| *I තීරුව*<br>*බලතල පවරනු ලබන නිලධරයන්* | *II තීරුව*<br>*නිලධාරි ගණය* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 1. මහ නගර සභා නාගරික කොමසාරිස්වරුන්<br><br>2. නගර සභා ලේකම්වරුන්<br><br>3. ප්‍රාදේශීය සභා ලේකම්වරුන් | MT-3, RS-1, RS-2, RS-3, RS-4, RS-5, MN-1 හා PL වැටුප් බණ්ඩය දරන තනතුරුධාරීන් | පළාත් පාලන ආයතන විධායක ප්‍රධානියාගේ කැමැත්ත හා එකඟත්වය මත<br><br>(අ) තම ආයතනයේ තනතුරුවලට පත් කිරීම, බල ප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම හා ආයතනික කටයුතු<br><br>(ආ) සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |

10-289